# 3. උතුම් ම මැවිල්ල

ආදම් : හරි ම ලස්සන උයනක් නේ ද?

ඒව ඔව්. ලස්සන මල්. රස පලතුරු. පාට පාට කුරුල්ලෝ හරි ම ලස්සනයි.

ආදම් : අර බලන්නකෝ. පුංචි සතෙක් වළකට වැටිලා. අනේ ! ගොඩට එන්න බැහැ වාගෙ.

ආදම් : ඉන්න. ඉන්න. මම ගොඩට ගන්නම්. ආ මෙන්න. මේ පුංචි පැටියව අර තණකොළ ගොඩේ තියන්න.

ඒව : හරිම ලස්සන සතෙක්. මේ බලන්නකො පිටේ ලස්සන සුදු තිත් තියෙනවා. මේ පුංචි පැටියගෙ නම මොකක් ද?

ආදම් : උගේ පිටේ ලස්සන තිත් තියෙනවා. ඒ හින්දා අපි ඌට "තිත් මුවා" කියමු.

ඒව : ආදම් අර කවුද? අර ගහ උඩ ටිං ටිං ගාන්නේ.

ආදම් : ඔව් ලස්සන සතෙක්. උගේ පිටේ ඉරි තුනක් තියෙනවා. අපි මේ සතාට ලේනා කියලා කියමු.

ඒව : අන්න හොඳයි. එතකොට අර මල්වල පැණි බොන ඉගිල්ලෙන සත්තු !

ආදම් : ඔව්. ඔව්. ඒ තමයි කුරුල්ලෝ. අපි උන්ට පැණි කුරුල්ලෝ කියමු.
අර කාක් කාක් කියන කුරුල්ලට අපි කාක්කා කියමු.
අර අළු පාට කුරුල්ලට අළුකොබෙයියා කියමු.

ඒව : අර වතුරේ ඉන්න සත්තු කවු ද?

ආදම් : උන්ට අපි මාළු කියමු.



ඒව : අද ඉඳලා මේ සත්තුන්ට අපි නම් කියලා කතා කරමු.

ආදම් : ඔව්. එතකොට දෙවි පියා හුඟක් සතුටු වේවි.

ඒව : මේ සත්තු හැමෝ ම ඉන්න කොට උයන හරි ම ලස්සනයි.

ආදම් : ඇත්ත තමා. ඒ වුණාට ඒ එක් කෙනෙකුටවත් නමක් තිබුණේ නැහැනේ.

ඒව : මේ සතුන්ට නම් තියන්න පුළුවන් වුණේ අපි දෙන්න සිටිය නිසා නේ. අපි දෙන්නා කොපමණ උතුම් ද?

ආදම් : දෙවි පියා තමයි අපට සතුන් නම් කරන්නට බලය දුන්නේ.

ඒව : දෙවි පියා අපිට කොච්චර ආදරේ ද?

ආදම් : ඔව්, අපි හැමදා ම එතුමාට ආදරේ කරමු.

පැවරුම්

1. පාඩමේ ඇති ලස්සන උයනේ සිටින සතුන්ගේ නම් ලියන්න.
2. සතුන්ට නම් තැබීමට ආදම් සහ ඒවට බලය දුන්නේ කවුද?
3. ඔබ කැමති මලක පින්තූරයක් අභ්‍යාස පොතේ ඇඳ පාට කරන්න. එම මලෙහි නම ලියන්න. 'ලස්සන මල් ලබාදුන් දෙවි පියාට මම ආදරෙයි' යන වැකිය ඊට උඩින් ලියන්න.